**නිපුණතා ආංශික සංවර්ධන වැඩසටහන - 2021**
**---------------------------------------------------**

නිපුණතා ආංශික සංවර්ධන වැඩසටහනේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ආසියානු සංවර්ධන බැංකුව අතර 2014 මැයි 27 දින එළඹි අංක 3119 එස්ආර්අයි (එස්එෆ්) සහ 3120 එස්ආර්අයි (එස්එෆ්) දරන ණය ගිවිසුම්වල iv ව්‍යවස්ථාවේ 4.04(අ) වගන්තිය සහ 2018 මැයි 11 දින එළඹි අංක 3650 එස්ආර්අයි(සීඕඑල්) සහ 3651 එස්ආර්අයි දරන අතිරේක ණය ගිවිසුම් වල විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතු යැයි මා සලකන මගේ අදහස් හා නිරීක්ෂණය මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 වැඩසටහන ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා වැඩසටහන් කාලය
**--------------------------------------------------------------------------------------------**

ණය ගිවිසුම අනුව, එවකට නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය එනම් වත්මන් අධ්‍යාපන අමාත්‍යාංශය වැඩසටහන ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර අනෙකුත් ආයතන 10 ක් වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ. 2020 වනවිට දේශීය හා විදේශීය ශ්‍රම වෙළඳපලේ ඉල්ලුම සපුරාලීමට කාර්යක්ෂම අධ්‍යාපන පද්ධතියක් ගොඩනැගීම හා වෘත්තීය පුහුණුව සඳහා තත්ත්වය, අදාළතාවය, ප්‍රවේශය, පිළිගැනීම මෙන්ම උපකාරක ප්‍රතිපත්ති, පද්ධති හා ආකෘති වැඩිදියුණු කිරීම වැඩසටහනේ අරමුණු වේ. වැඩසටහන් ක්‍රියාකාරකම් ප්‍රතිඵල පදනම් (lending mode) ක්‍රමය අනුව ක්‍රියාත්මක වේ. ණය ගිවිසුම අනුව, වැඩසටහනේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 141,524.23 කට සමාන එජඩො මිලියන 1,061.2 ක් වූ අතර ආසියානු සංවර්ධන බැංකුව සහ ජාත්‍යන්තර සංවර්ධන සංගමය පිළිවෙලින් රු.මිලියන 28,708.23 කට සමාන එජඩො මිලියන 200 ක්ද, රු.මිලියන 13,100 කට සමාන එජඩො මිලියන 100ක්ද බැගින් ලබාදී තිබුණි. ඉතිරිය එජඩො මිලියන 761.2 ක් ජර්මන් රජය, කොරියාවේ අපනයන හා ආනයන බැංකුව, ශ්‍රී ලංකා රජය හා අනෙකුත් ප්‍රභවයන් විසින් මූල්‍යයනය කර තිබුණි. වැඩසටහනෙහි කටයුතු 2014 වර්ෂයේ සැප්තැම්බර් ආරම්භ කරන ලද අතර 2022 ජුනි 30 වනවිට නිම කිරීමට නියමිතය.

## 1.3 මතය
**------**

ඒජන්සි 11 හි මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇති තොරතුරුවලට අනුකූලව 2021 දෙසැම්බර් 31 දින වන විට ව්‍යාපෘතියේ ඒකාබද්ධ මුළු වියදම් ප්‍රකාශය සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම
**---------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ ඒකාබද්ධ මුළු වියදම් ප්‍රකාශය විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තව දුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 ඒකාබද්ධ මුළු වියදම් ප්‍රකාශය සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම
**------------------------------------------------------------------------------------------------------------**

මෙම ඒකාබද්ධ මුළු වියදම් ප්‍රකාශය ඒජන්සි 11 හි මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇති තොරතුරුවලට අනුකූලව සත්‍ය හා සාධාරණ ලෙස පිළියෙල කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව ඒකාබද්ධ මුළු වියදම් ප්‍රකාශය පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයක් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතිය මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

## 1.6 ඒකාබද්ධ මූළ වියදම් ප්‍රකාශය විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විමට ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කර ගන්නා බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් ඇති විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින්, වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය පිළිබඳ අවබෝධයක් ලබාගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිත භාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තු හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සමස්ත ඉදිරිපත් කිරීම ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම. හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව වගකීම් දරන්නන් දැනුවත් කරන ලදී.

**2. ඒකාබද්ධ මුළු වියදම් ප්‍රකාශය පිළිබඳ අදහස් දැක්වීම**

**2.1 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

| අංකය | **නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව** | **අනුකූල නොවීම** | කළමනාකරණ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.8 ඡේදය ප්‍රකාරව | කොන්ත්‍රාත්කරු විසින් කොන්ත්‍රාත් ගිවිසුම උල්ලංඝණය කළ හොත් ප්‍රසම්පාදන අස්ථිත්වය ආරක්ෂා කිරීම සඳහා ඇස්තමේන්තුගත කොන්ත්‍රාත් මුදලින් සියයට පහකට නොඅඩු මුදලක් කාර්යය සාධන සුරක්ෂණයක් වශයෙන් ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් තබාගත යුතුවේ. එයට පටහැනිව ජාතික තරුණ සේවා සභාව විසින් 2017 වර්ෂයේ ගිවිසුම්ගත වටිනාකම රු.මිලියන 129.9 ක් වූ මොණරාගල පුහුණු මධ්‍යස්ථානය ඉදිකිරීමේ ව්‍යාපෘතියේ කාර්යය සාධන ඇපකරයේ වටිනාකම රු. 1,999,407 ක් අඩුවෙන් ලබාගෙන තිබුණි. | අදහස් දක්වා නැත. | මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ අංක DMS/චක්‍රලේඛ/2017 හා 2017 ඔක්තෝබර් 25 දිනැති අංක 05/2017 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛය | පුහුණු වන උපදේශක කාර්ය මණ්ඩල අධීක්ෂණය කිරීමේ කාර්යයන් වෙනුවෙන් ඊට අදාල නිර්ණායකයන් පදනම් කරගෙන මාසිකව රු. 5,000 ක උපරිමයකට යටත්ව කාර්ය සාධන දීමනාවක් ගෙවීමට අනුමැතිය ලබාදී තිබුණද ජාතික තරුණ සේවා සභාවේ පළාත් 09 ක හා මහරගම පුහුණු මධ්‍යස්ථානයේ නිලධාරීන් 58 දෙනෙකුට රු. 253,600 ක් වැඩිපුර ගෙවා තිබුණි. | අදහස් දක්වා නැත. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**3. භෞතික කාර්යසාධනය**

**3.1 ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය**

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

| අංකය | 2021 දෙසැම්බර් 31 දිනට අපේක්ෂිත භෞතික ප්‍රගතිය | කළමනාකරණ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ආසියානු සංවර්ධන බැංකු ණය ගිවිසුම් අංක 3650 හා 3651 ප්‍රකාරව ළඟාකරගතයුතු උපයෝජන දර්ශක ප්‍රධාන වශයෙන් 09 ක් ඇති අතර එම දර්ශකයන්ට අදාලව ඉලක්ක 51 ක් සපුරා ගත යුතු වුවත්, සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් ඉලක්ක 08 ක් සම්පූර්ණයෙන්ම අවසන් කර නොතිබුණු අතර තවත් එක් ඉලක්කයක් අවසන් කර තිබුණේ සියයට 85 ක ප්‍රමාණයක් පමණි. | වර්ෂය තුළ කොවිඩ් 19 වසංගතය හේතුවෙන් ප්‍රමාණවත් අයවැය ප්‍රතිපාදන , මුදල් ප්‍රවාහ සීමා , සීමිත වැඩසටහන් කාර්ය මණ්ඩලය සහ පුහුණු මධ්‍යස්ථාන සහ කර්මාන්ත අර්ධ/ සම්පූර්ණ වශයෙන් වසා දැමීම හේතුවෙන් ඉලක්ක 08 ක් සාක්ෂාත් කර ගැනිම ප්‍රමාද විය. | ණය ගිවිසුම් යටතේ වන උපයෝජන දර්ශකයන්හි ක්‍රියාකාරකම්වල ඉලක්කයන් සපුරා ගැනීම කෙරෙහි කළමණාකරණයේ අවධානය යොමු විය යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය තුළ ව්‍යාපෘති අධීක්ෂණ ඒකකය විසින් ඇ.එ.ජ.ඩො. මිලියන 23 ක් ප්‍රතිපූර්ණය කරගෙන තිබුණු අතර ව්‍යාපෘති කාලය අවසන් වී තිබුණද ඇ.එ.ජ. ඩොලර් මිලියන 11.3 ක් තවදුරටත් ප්‍රතිපූර්ණය කරගැනීමට නොහැකිව ඉතිරි වී තිබුණු බව නිරීක්ෂණය විය. | 2022.03.31 වන විට එජඩො මිලියන 7 ක් ප්‍රතිපූර්ණය කර ගෙන ඇත. ඉතිරි එජඩො මිලියන 4 ව්‍යාපෘති දිර්ඝ කාල සීමාව තුළ ප්‍රතිපූර්ණය කර ගැනිමට නියමිතය. | අරමුදල් පරිහරණය කිරීමේ අකාර්යක්ෂමතාවය පෙන්නුම් කර ඇත. ව්‍යාපෘතියේ ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා කළමනාකාරිත්වය අවශ්‍ය පියවර ගත යුතුය. |
| (ඇ) | 2021 වර්ෂයේදී ව්‍යාපෘති අධීක්ෂණ ඒකකය විසින් රැකියා අභිමුඛ පුහුණු වැඩසටහන සඳහා රු. මිලියන 79 ක් වැයකර තිබුණු බව නිරීක්ෂණය වූ අතර ඉලක්කය වූ අතිරේක පුහුණුලාභීන් 2000 දෙනා බඳවාගෙන කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමට කටයුතුකර නොතිබුණි. මෙම පුහුණු වැඩසටහන සඳහා බඳවාගෙන තිබුණු මුළු අභ්‍යාසලාභීන්ගේ එකතුව 8419 යෙන් 3161 ක් සිසුන් පාඨමාලා හැරගොස් තිබුණි. | ඊඑල්ටිපී(ඉදිකිරීම්, නිෂ්පාදන,සංචාරක,සෞඛ්‍ය සේවා ආදි) යටතේ තෝරාගත් අංශවල ඉහළ ඉල්ලුම හේතුවෙන් සමහර අභ්‍යාසලාභින් රුකියා අවස්ථා ලබාගෙන සහතිකය ලබා ගැනිමට පෙර පුහුණු වැඩසටහනෙන් ඉවත් වේ.එබැවින් ප්‍රදානය කරන ලද සහතික ප්‍රමාණය ලියාපදිංචි වු සංඛ්‍යාවට වඩා අඩු විය හැක. | වැඩසටහනේ අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීම සඳහා පුහුණු විම් සැලසුම් කිරිමට හා ක්‍රියාත්මක කිරිමට කළමනාකාරිත්වය අවශ්‍ය පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | කාර්මික ආයතනවල සේවය කරන කාර්ය මණ්ඩලයේ නිපුණතාවය වැඩි දියුණු කිරීමට සහ සහතිකලාභීන්ගේ නිපුණතා පරතරය අවම කිරීමේ අදහසින් නම්‍යශීලී පුහුණු වැඩසටහන සඳහා සමාලෝචිත වර්ෂයේදී රුපියල් මිලියන 17.5 ක් වෙන්කර තිබුණද, ඉන් රුපියල් මිලියන 5 ක් පමණක් වැයකර තිබුණු අතර 2021 වර්ෂය තුළ ඉලක්කය වූයේ කාර්මික ක්ෂේත්‍රයේ නියුතු 2000 කට නම්‍යශීලී පුහුණු වැඩසටහන තුළින් පුහුණුව ලබාදීම වුවද 2021 වර්ෂය අවසාන වන විට 1175 දෙනෙකුට පමණක් පුහුණුව ලබාදී තිබුණි.. | කොවිඩ් 19 වසංගතය හේතුවෙන් මුදල් ප්‍රවාහ සීමාවන් සහ පුහුණු මධ්‍යස්ථාන සහ කර්මාන්ත අර්ධ/ සම්පූර්ණ වශයෙන් වසා දැමීම හේතුවෙන් නම්‍යශිලි ඉගෙනුම් වැඩසටහන යටතේ අයවැය වියදම් කර නොකරන ලදී. | අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීම සඳහා කළමනාකාරිත්වය අවශ්‍ය පියවර ගත යුතුය. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

| අංකය | විගණන ගැටළුව | කළමනාකරණ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වෘත්තීය තාක්ෂණ විශ්ව විද්‍යාලයේ පශ්චාත් උපාධි අධ්‍යන පාඨමාලාව සඳහා 32 දෙනෙකු බඳවාගෙන තිබුණු අතර පාඨමාලාව අවසන් කර තිබුණේ පුහුණුලාභීන් 12 දෙනෙකු පමණක් බව ප්‍රගති වාර්තා අනුව නිරීක්ෂණය විය. | අදහස් දක්වා නැත. | වැඩසටහනේ අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීම සඳහා පුහුණු විම් සැලසුම් කිරිමට හා ක්‍රියාත්මක කිරිමට කළමනාකාරිත්වය අවශ්‍ය පියවර ගත යුතුය. |
| (ආ) | වෘත්තීය පුහුණු අධිකාරියේ "රැකවරණී" පුහුණු වැඩසටහන සඳහා රු.මිලියන 01 ක් සංශෝධිත ක්‍රියාකාරී සැලැස්මෙන් වෙන්කර තිබුණද අභ්‍යාසලාභීන් 61 ක් පමණක් බඳවාගෙන ඒ සඳහා රු. 536,000 ක් හෙවත් සියයට 53.6 ක් වැය දරා තිබුණි. | "රැකවරණී" පුහුණු වැඩසටහනේ මුල්‍ය ප්‍රගතියට අදාල විගණන නිරික්ෂණයට වැඩසටහනේ කළමනාකරණය එකග වේ. | අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීම සඳහා කළමනාකාරිත්වය අවශ්‍ය පියවර ගත යුතුය. |
| (ඇ) | වෘත්තීය තාක්ෂණ විශ්ව විද්‍යාලයේ යුඔවිටි සහ යුසීඑස් හි කාර්ය මණ්ඩලය විසින් පවත්වනු ලබන උපකාරක අධ්‍යයන පර්යේෂණ සහ නවෝත්පාදන ව්‍යාපෘති සඳහා රුපියල් මිලියන 4 ක ප්‍රතිපාදන වෙන්කර තිබූ නමුත් මූල්‍ය ප්‍රගතියක් අත්කරගෙන නොතිබුණු අතර ව්‍යාපෘති යෝජනා 5 ක් පමණක් අනුමැතිය සඳහා ඉදිරිපත් වී තිබුණි. | අදහස් දක්වා නැත. | අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීම සඳහා කළමනාකාරිත්වය අවශ්‍ය පියවර ගත යුතුය. |
| (ඈ) | නව කාර්ය මණ්ඩල බඳවා ගැනීම් සිදුකර, එම නිලධාරීන් හට මාස 2 1/2 ක පුහුණුවක්ද ලබාදීම සඳහා ප්‍රතිපාදන වෙන්කර තිබුණද ජාතික තරුණ සේවා සභාව මෙන්ම වෘත්තීය | අදහස් දක්වා නැත. | අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීම සඳහා කළමනාකාරිත්වය අවශ්‍ය පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | පුහුණු අධිකාරිය නව බඳවාගැනීම් සිදුකිරීමට අවධානය යොමුකර නොතිබුණු අතර වෘත්තීය පුහුණු අධිකාරිය අළුතින් බඳවාගත් උපදේශකවරුන් සඳහා හඳුන්වාදීමේ පුහුණු වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි. | | |
| (ඉ) | නිපුණතා ආංශික සංවර්ධන වැඩසටහන 2014 වර්ෂයේදී ආරම්භ කර 2021 ජුනි 30 දින වන විට ඉලක්ක සියයට 100 ක් සම්පූර්ණ කිරීමට සැලසුම් කර තිබුණද ඉලක්ක ලඟා කර ගැනීමට නොහැකි වීම නිසා ව්‍යාපෘති කාලය 2022 ජුනි 30 දක්වා දීර්ඝ කර තිබුණි. මේ හේතුවෙන් මහා භාණ්ඩාගාරයට ලැබිය යුතු ඩොලර් මිලියන 4 මේ දක්වා ලබාගැනීමට නොහැකි වී තිබුණි. ව්‍යාපෘති කාලය වසරකින් දීර්ඝ කිරීම නිසා කාර්ය මණ්ඩල වැටුප් හා දීමනා ඇතුළු පුනරාවර්තන වියදම්වල වැය දැරීම වැඩිවීම හේතුවෙන් අතිරේක වියදමක් දැරීමට සිදුව ඇති බවත්, ඒ අනුව ව්‍යාපෘතියේ නියම වාසිය රජයට අත්කර ගැනීමට නොහැකි වී තිබුණි. | කොවිඩ් 19 වසංගතය හේතුවෙන් මෙම කාලසීමාව තුළ පුහුණු මධ්‍යස්ථාන සම්පූර්ණ හෝ අර්ධ වශයෙන් වසා දැමීමේ ප්‍රතිඵලයක් ලෙස 2020 සහ 2021 වසර තුළ ක්‍රියාත්මක කිරීමට නියමිත වැඩසටහන් ක්‍රියාකාරකම්වලට දැඩි බලපෑමක් එල්ල විය. | ණය කාලසීමාව අතරතුර අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීම සඳහා කළමනාකාරිත්වය අවශ්‍ය පියවර ගත යුතුය. |
| (ඊ) | වෘත්තීය තාක්ෂණ විශ්ව විද්‍යාලයේ පාඨමාලා වැඩසටහන සඳහා තිස් දෙදෙනෙකු තෝරාගෙන රුපියල් මිලියන දෙකක් වෙන්කර තිබූ නමුත් 2021 දෙසැම්බර් 15 දිනට එහි මූල්‍ය ප්‍රගතිය සියයට 12 ක් විය.එමෙන්ම පශ්චාත් උපාධි ශිෂ්‍යත්ව වැඩසටහන සඳහා 16 දෙනෙකු ඉලක්ක කර රුපියල් මිලියනයක් වෙන්කර තිබුණද වැඩසටහන සඳහා මූල්‍ය ප්‍රගතියක් අත්කරගෙන නොතිබිණි. | අදහස් දක්වා නැත. | අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීම සඳහා කළමනාකාරිත්වය අවශ්‍ය පියවර ගත යුතුය. |
| (උ) | රත්මලාන විශ්ව විද්‍යාල විද්‍යාතනයේ නිපුණතා ආංශික වැඩසටහන යටතේ 2021 වර්ෂය සඳහා රුපියල් මිලියන 10 ක් කාර්යයන් 4 ක් වෙනුවෙන් වෙන්කර තිබූ නමුත් ඉන් එක් කාර්යයක් හැර අනෙකුත් කාර්යයන් සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා දී නොතිබුණද විගණිත දින වන විටත් එකී කාර්යයන් ඉටුකර නොතිබුණු බව නිරීක්ෂණය විය. | අදහස් දක්වා නැත. | අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීම සඳහා කළමනාකාරිත්වය අවශ්‍ය පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඍ) | විශ්ව විද්‍යාල විද්‍යායතනවල එන්වීකිවු 5,6 මට්ටමේ පාඨමාලා සම්පූර්ණ කර වෘත්තිය තාක්ෂණ විශ්ව විද්‍යාලයේ උපාධි පාඨමාලා සඳහා අයදුම් කිරීමේ දී හදාරන ලද විෂයන්ට සෘජු සම්බන්ධයක් ඇති උපාධි පාඨමාලාවන් හැදෑරීමට අවස්ථාව ඇති පරිදි විශ්ව විද්‍යාලයේ උපාධි පාඨමාලා හඳුන්වාදී නොතිබුණු අවස්ථා නිරීක්ෂණය විය. | අදහස් දක්වා නැත. | අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීම සඳහා කළමනාකාරිත්වය අවශ්‍ය පියවර ගත යුතුය. |

**3.3 කොන්ත්‍රාත් පරිපාලනය**

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

| අංකය | විගණන ගැටළුව | කළමනාකරණ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2017 වර්ෂයේ සිට ඉදිකිරීම් ආරම්භ කළ එකතුව රු. මිලියන 1226.78 ක් වටිනා ව්‍යාපෘති 04 ක් 2022 පෙබරවාරි වන විටත් වැඩ අවසන් කර නොතිබුණි. එහි ප්‍රමාද කාලය මාස 05 සිට අවුරුදු 02 අතර පවතින බව නිරීක්ෂණය විය. | නිපුණතා අංශයේ සංවර්ධන වැඩසටහන යටතේ ඉදිකිරීම් ව්‍යාපෘති හතරක තත්ත්වය<br>- කොවිඩ් සහ ද්‍රව්‍ය නොතිබීම හේතුවෙන් ප්‍රමාද විම.<br>- දුර්වල ප්‍රගතිය හේතුවෙන් සාමකාමී විසඳුමක් සඳහා සැලසුම් කර ඇත.<br>- වැඩ නතර කර කොන්ත්‍රාතුව හෝ සේවාදායකයාට එරෙහිව නඩුවක් ගොනු කිරීම. | ඉදිකිරීම් කටයුතු කඩිනම් කිරීම සඳහා කළමනාකරණයේ අවධානය යොමුකළ යුතුය. |
| (ආ) | 2017 හා 2018 වර්ෂවල ඉදිකිරීම ආරම්භ කරන ලද එකතුව රු.මිලියන 348 ක් වටිනා ව්‍යාපෘති 02 ක් වැඩ අවසන් කර වර්ෂයකට වඩා වැඩි කාලයක් භාවිතයට නොගෙන නිෂ්කාර්යව තිබූ බව නිරීක්ෂණය විය. | අදහස් දක්වා නැත. | අපේක්ෂිත පුහුණු වැඩසටහන් සඳහා ගොඩනැගිලි භාරදීමෙන් පසුව මෙහෙයුම් කටයුතු ආරම්භකිරීම සඳහා අවශ්‍ය පියවර ගත යුතුය. |
| (ඇ) | ආංශික නිපුණතා සංවර්ධන අරමුදල් යටතේ ඉදිකරන ලද කෑගල්ල දිස්ත්‍රික් වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන ගොඩනැගිල්ල ඉදිකිරීමට අදාල දෝෂ සහිත ඉංජිනේරු ඇස්තමේන්තුවක් පදනම් කරගෙන ඇගයීම් කටයුතු සිදු කිරීම හා තෝරාගත් ලංසුකරු තුලනාත්මක නොවන ලංසුවක් ඉදිරිපත් කිරීම හේතුවෙන් ආයතනයට | අදහස් දක්වා නැත. | වගකිව යුතු පාර්ශවයන්ට අදාලව විමර්ශනයක් සිදුකිරීමට අවශ්‍ය පියවර ගත යුතුය. |

රු. මිලියන 3 ක පාඩුවක් හා එම කොන්ත්‍රාත්තුව ඉටු කිරීමට අදාල බිල්පත්වලට අදාලව භෞතික මිනුම් ගැනීමේදී රු. මිලියන 4.8ක වැඩිපුර ගෙවීමක් කර තිබුණි.

## 3.4 නිෂ්කාර්ය වත්කම්

| විගණන ගැටළුව | කළමනාකරණ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| ව්‍යාපෘතිය මගින් 2015 අගෝස්තු 24 දින බටංගල විශ්ව විද්‍යාලයට ලබා දී තිබූ එකතුව රුපියල් 464,400 ක් වටිනා නාන කාමර උපාංග 2022 ජනවාරි 31 දින වන විටත් නිෂ්කාර්යව පැවතුණි. | අදහස් දක්වා නැත. | වත්කම් භාවිතා කිරීම සම්බන්ධව කළමනාකාරිත්වය අවශ්‍ය පියවර ගත යුතුය. |

## 3.5 මානව සම්පත් කළමනාකරණය

| විගණන ගැටළුව | කළමනාකරණ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| ව්‍යාපෘති අධීක්ෂණ ඒකකයේ සමාලෝචිත වර්ෂය අවසාන දිනට ප්‍රසම්පාදන විශේෂඥ, සහකාර ප්‍රසම්පාදන විශේෂඥ, සිවිල් ඉංජිනේරු පරිසර ආරක්ෂණ නිලධාරී සහ අභ්‍යන්තර විගණක ඇතුළු තනතුරු 11 ක් වසර 01 සිට වසර 04 දක්වා කාලයක් පුරප්පාඩු වී පැවතුණි. | වැඩසටහන් ක්‍රියාකාරකම්වල අවශ්‍යතාවය මත තනතුරු පුරවනු ලබන අතර, එම අවස්ථාවේ ක්‍රියාකාරකම් මත පදනම්ම පිරවීමේ අවශ්‍යතාවයක් ඇති වන තෙක් ඇතැම් තනතුරු පුරප්පාඩු පවතිනු ඇත. | ව්‍යාපෘති අධීක්ෂණ ඒකකය කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම සඳහා නිලධාරීන් යෙදවීමට කටයුතු කළ යුතුය. |